# මහජනතාව වෙත කෙරෙන දැනුම් දීමයි

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

## මහජනතාවගේ තැන්පතු භාර ගැනීම සඳහා අවසරලත් බලපත්‍රලාභී මුදල් සමාගම් (2020 සැප්තැම්බර් මස 30 දිනට)

- සමස්ථ මූල්‍ය පද්ධතියෙහි ස්ථායිතාවය සහ සුරක්ෂිතභාවය පවත්වා ගෙන යාම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ ප්‍රතිපාදන අනුව සහ ඒ යටතේ නිකුත් කරන ලද විධාන අනුව, බලපත්‍රලාභී මුදල් සමාගම් නියාමනය සහ අධීක්ෂණය සිදු කරනු ලබයි. කෙසේ වෙතත් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරනු ලබන නියාමනය සහ අධීක්ෂණය, බලපත්‍රලාභී මුදල් සමාගම් ද ඇතුලුව කිසිදු මූල්‍ය ආයතනයක අසාර්ථකවීමක් අනිවාර්යයෙන්ම වලක්වන බව සහතික නොකරයි.
- යම්කිසි බලපත්‍රලාභී මුදල් සමාගමක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විචක්ෂණශීලී අවශ්‍යතාවලට අනුගත නොවන්නේ නම්, ඒ සඳහා පනතේ ඇති බලතල ප්‍රකාරව නියාමන ක්‍රියාමාර්ග ගැනීමට හැකියාව ඇත. එසේ වුවත් ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන හා අධීක්ෂණ අවශ්‍යතාවලට අනුකූල වීම මෙන්ම බලපත්‍රලාභී මුදල් සමාගමේ මෙහෙයුම් කටයුතු ස්ථාවරව සහ සුරක්ෂිතව පවත්වාගෙන යාමේ මූලික වගකීම එහි කළමණාකාරීත්වයට පැවරී ඇත.
- බලපත්‍රලාභී මුදල් සමාගමක තැන්පතු පිළිබඳ සහතික වීමට ශ්‍රී ලංකා මහ බැංකුවට නෛතික බලයක් නොමැත. සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම් සියලුම තැන්පතු වගකීම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිහිටුවන ලද ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක ක්‍රමය යටතේ රක්ෂණය සිදු කල යුතුය. වර්තමානයේදී බලපත්‍රය අත්හිටුවීම/ අවලංගු කරන ලද මුදල් සමාගමක එක් තැන්පතුකරුවෙකු/ එක් ආයතනයක් වෙත උපරිමය රුපියල් ලක්ෂ 6ක් (රු.600,000) දක්වා තැන්පතු ගෙවීම සිදු කරයි. මුදල් සමාගමක බලපත්‍රය අවලංගු කිරීමක දී තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක ක්‍රමය යටතේ වන්දි ගෙවීම සිදු කරනු ලබන්නේ තැන්පතු සඳහා පමණක් වන අතර අනෙකුත් මුදල් ලබා ගැනීමේ උපකරණ සඳහා ගෙවීම් සිදු කිරීම ආවරණය නොවේ.
- මුදල් ව්‍යාපාර පනතේ ප්‍රතිපාදන අනුව සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම්, තම සමාගමේ මූලික මූල්‍ය තොරතුරු/දර්ශකයන් මහජනතාවට නිවැරදි ආයෝජන තීරණ ගැනීමට පහසුවීම සඳහා සෑම සය මසකට වරක්ම පුවත්පත් වල පලකිරීම අනිවාර්ය වේ.
- තැන්පතු ඇතුලුව සිදුකරනු ලබන ඕනෑම අයෝජනයක අවදානම ඒවායේ ප්‍රතිලාභ සමග ධනාත්මක ලෙස සම්බන්ධ වන බැවින් ඒ පිලිබද මහජනතාවගේ අවධානය යොමු කරනු ලැබේ.
- ඉහත කරුණු පිලිබඳ සැලකිලිමත් වෙමින්, තමන් විසින් තැන්පත් කරනු ලබන අරමුදල්වල සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් සැලකිලිමත් වන ලෙස සහ අනවසර ආයතනවල/ පුද්ගලයින් සමග අරමුදල් තැන්පත් කිරීමෙන් වලකින ලෙස මහජනතාවට අවවාද කරනු ලැබේ.

## බලපත්‍රලාභී මුදල් සමාගම්
### (අකාරාදී අනුපිළිවෙලට)

1. අබාන්ස් ෆිනෑන්ස් පී එල් සී
2. අයිඩියල් ෆිනෑන්ස් ලිමිටඩ්
3. ආර්පිකෝ ෆිනෑන්ස් කම්පැනි පී එල් සී*
4. ඇසෝෂියේටඩ් මෝටර් ෆිනෑන්ස් කම්පැනි පී එල් සී *
5. එලයන්ස් ෆිනෑන්ස් කම්පැනි පී එල් සී
6. එල් ඕ එල් සී ෆිනෑන්ස් පී එල් සී
7. එච් එන් බී ෆිනෑන්ස් පී එල් සී
8. එල් බී ෆිනෑන්ස් පී එල් සී
9. එල් ඕ එල් සී ඩිවෙලොප්මන්ට් ෆිනෑන්ස් පී එල් සී
10. ඒ එම් ඩබ්ලිව් කැපිටල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී එල් සී
11. ඒෂියා ඇසෙට් ෆිනෑන්ස් පී එල් සී
12. ඔරියන්ට් ෆිනෑන්ස් පී එල් සී
13. කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ් *
14. කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පී එල් සී
15. කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී එල් සී
16. ට්‍රේඩ් ෆිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් පී එල් සී
17. ඩයලොග් ෆිනෑන්ස් පී එල් සී
18. නේෂන් ලංකා ෆිනෑන්ස් පී එල් සී **
19. ප්‍රයිම් ෆිනෑන්ස් පී එල් සී
20. පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී එල් සී
21. පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පී එල් සී
22. බිම්පුත් ෆිනෑන්ස් පී එල් සී *
23. මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පී එල් සී
24. මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පී එල් සී *
25. මල්ටි ෆිනෑන්ස් පී එල් සී
26. යූ බී ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ් *
27. රිචඩ් පීරිස් ෆිනෑන්ස් ලිමිටඩ් *
28. ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆිනෑන්ස් ලිමිටඩ්
29. වැලිබල් ෆිනෑන්ස් පී එල් සී
30. සර්වෝදය ඩිවෙලොප්මන්ට් ෆිනෑන්ස් ලිමිටඩ්
31. සෙංකඩගල ෆිනෑන්ස් පී එල් සී
32. සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි පී එල් සී
33. සෙරෙන්ඩිබ් ෆිනෑන්ස් ලිමිටඩ්
34. සිටිසන්ස් ඩිවෙලොප්මන්ට් බිස්නස් ෆිනෑන්ස් පී එල් සී
35. සිංගර් ෆිනෑන්ස් (ලංකා) පී එල් සී
36. සියපත ෆිනෑන්ස් පී එල් සී
37. සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පී එල් සී *
38. ෆින්ට්‍රෙක්ස් ෆිනෑන්ස් ලිමිටඩ්

* අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අවශ්‍යතාවය සපුරා නොමැති අතර එම විධානයන්ට අනුකූල වීම සඳහා කාල දිගුවක් ලබා දී ඇත.

** අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අවශ්‍යතාවය සපුරා නොමැති අතර ආයතනය විසින් මේ දක්වා ප්‍රාග්ධනය වර්ධනය කිරීමේ පිළිගතහැකි සැලැස්මක් ඉදිරිපත් කර නොමැත.

\# 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා සිංහපුත්‍ර ෆිනෑන්ස් පී එල් සී වෙත නිකුත් කර ඇති බලපත්‍රය අවලංගු කිරීමේ දැන්වීමක් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් මෙම ආයතනයට නිකුත් කරනු ලැබ ඇත. කෙසේ වෙතත්, මුදල් ව්‍යාපාර පනත අනුව නියම කරන ලද කාල රාමුව තුල යෝජිත ප්‍රාග්ධන වර්ධනය කිරීමේ සැලස්ම ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනය වෙත අවස්ථාවක් ලබා දීමට මුදල් මණ්ඩලය තීරණය කර ඇත.

සටහන : අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අවශ්‍යතාවයට අනුකූල නොවන බලපත්‍රලාභී මුදල් සමාගම්වල නාමයන් සඳහන් කර ඇත්තේ එය තැන්පතුකරුවන්ට සැලකිය යුතු අවදානමක් ඇති කරන බැවිනි.


**අධ්‍යක්ෂ - බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව**

ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01

0112477504 0112477738 dsnbfi@cbsl.lk